# 1.26 ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වල හින්දුස්ථානි රාගධාරී සංගීතය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත වන ශිල්ප ක්‍රම

ඩබ්ලිව්.කේ. රුවින් රංගීත් ඩයස්
දෘශ්‍ය කලා සැලසුම්කරණ හා ප්‍රාසංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

වසර හැටක පමණ කාලයක සිට ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසැල් වල සහ වසර තිහක පමණ කාලයක සිට විශ්වවිද්‍යාල සහ විශ්ව විද්‍යාල ආයතන වලද හින්දුස්ථානි ශාස්ත්‍රීය සංගීතය ඉගැන්වීම සිදුකෙරේ. එසේ වුවද තෘතීයික අධ්‍යාපනයෙන් පසුව ශාස්ත්‍රීය කරුණු ආශ්‍රයෙන් ස්වයං සහ ක්ෂණික පරිකල්පනාවන් මගින් නිර්මාණාත්මකව සංගීත ආකෘතියක් ඉදිරිපත් කිරීමේ හැකියාව බොහෝ උපාධිධාරීන් සතුව නොමැති බව පෙනී යයි. එම ගැටළුවට හේතු වන කරුණු පිළිබඳව කරන ලද මෙම අධ්‍යනය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කැලණිය, ජයවර්ධනපුර හා පේරාදෙණිය යන විශ්වවිද්‍යාල ඇසුරෙන් තොරතුරු ලබාගන්නා ලදී. මාගේ අධ්‍යයනයේ විභාග කරන ලද මූලික උපන්‍යාසය වූයේ ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා වල හින්දුස්ථානි රාගධාරී සංගීතය ඉගැන්වීමේ ශිල්ප ක්‍රමවේදයන්හී ඇති දුර්වලතා මීට හේතු කාරක වන බවයි. මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් එම ගැටලුව පිළිබඳව මා විසින් කරන ලද අධ්‍යයනයෙන් ලබාගත් ප්‍රතිඵල විශ්ලේෂණයට භාජනය කෙරේ.